## බලන්ගොඩ නගර සභා රැස්වීම් වාර්තාව

ස්ථානය : බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව.

දිනය : 2010.04.29

වේලාව : පෙ.ව.10.00

බලන්ගොඩ නගර සභාවේ ගරු සභාපති, ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.

**සහභාගීත්වය:-**

| | |
|---|---|
| 01. ගරු සභාපති, | ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා |
| 02. ගරු උපසභාපති | සුමේද චාමින්ද බස්නායක මැතිතුමා |
| 03. ගරු නාගරික මන්ත්‍රී | ඊ.ඒ.ජේ.ප්‍රේමකුමාර මැතිතුමා |
| 04. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා |
| 05. ගරු නාගරික මන්ත්‍රී | ධර්මසේන සමරසිංහ මැතිතුමා. |
| 06. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම්. රූමි මැතිතුමා |
| 07. ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 08. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.විමලසේන මැතිතුමා |
| 09. ගරු නාගරික මන්ත්‍රී | යූ.එච්. ගාමිණී මැතිතුමා |

**නිලධාරී සහභාගීත්වය:-**

01. ආර්.ඩී.නලින් පුෂ්පකුමාර ලේකම්

(01) **ආගම සිහිකිරිම:**

රැස්වීමට පැමිණ සිටි සියළු දෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

(02) **ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන:**

ගරු සභාපතිතුමා කථාකරමින්, 2010 වර්ෂයේ අප්‍රේල් මාසයට අදාළව පවත්වනු ලබන මහ සභා රැස්වීමට සහභාගීවීමට පැමිණ සිටින ගරු මන්ත්‍රීතුමන්ලා හා ලේකම් මහතා මහතා සාදරයෙන් පිළිගන්නා බව ප්‍රථමයෙන්ම පැවසීය.

ඉන් අනතුරුව අදහස් දැක් වූ ගරු සභාපතිතුමා , මැතිවරණ ඉතිහාසයේ විශිෂ්ඨතම ප්‍රතිඵලය මෙවර පාර්ලිමේන්තු මැතිවරණයේ දී ජනතාව විසින් එක්සත් ජනතා නිදහස් සංධානය වෙත ලබාදී ඇතැයි පැවසීය. මෙම අතිවිශිෂ්ඨ ජයග්‍රහණය මහින්ද චින්තන වැඩ පිළිවෙළ නැවත නැවතත් ජනතාව විසින් අනුමත කිරීමක් ලෙස තමා සලකනු ලබන බව දැන්වූ ගරු සභාපතිතුමා , යුද්ධය නිමා වූ රටේ සංවර්ධනය යුද්ධය ජයග්‍රහණය කිරීමට අත්වැල් බැඳගැනීම සියළු දේශපාලන පක්ෂවල වගකීම යැයි අවධාරණය කරන ලදී. මෙවර බළන්ගොඩ ආසනයෙන් එක්සත් ජනතා නිදහස් සංධානයෙන් අපේක්ෂකයින් දෙදෙනෙකු මැතිවරණය සඳහා ඉදිරිපත් වූ අතර , ඔවුන් දෙදෙනාටම ජයග්‍රහණය කිරීමට නොහැකි වූ බවත් , නමුත් රත්නපුර දිස්ත්‍රික්කයෙන් ඉදිරිපත් වූ අපේක්ෂකයින් අතරින් අපේක්ෂකයින් 07 ජයග්‍රහණය කර ඇති බැවින් , ඔවුන්ගේ සහයෝගය ලබාගෙන බළන්ගොඩ පුරවරයේ සංවර්ධන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට හැකි සෑම අවශ්‍ය පියවරක්ම ගන්නා බව පැවසීය. පළාත් පාලන ආයතනවල

ධුරකාලය වසරකින් දිර්ඝ කර ඇති බැවින් , ඉදිරි පළාත් පාලන මැතිවරණය කොට්ඨාස ක්‍රමයට පැවැත්වීමට රජය තීරණය කර ඇතැයි ද සඳහන් කරන ලදී.

2010 වසර ජාතික සවිය ගම නැගුම වැඩ සටහන යටතේ මේවන විට මෙම නගර සභා බලප්‍රදේශයේ තුළ ලක්ෂ 30 පමණ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්ක කර ඒවායේ වැඩ අවසන් කරමින් පවතින අතර , ඉදිරියේ එම ව්‍යාපෘති ජනතා අයිතියට පැවරීමට ක්‍රියාමාර්ග ගන්නා බවද දැන්වීය. මහජනපොළ ඉදිකිරීමේ කටයුතු කටයුතු අවසන්ව ඇති අතර , එම කඩ කාමර කුළියට දීමෙන් ලැබෙන ආදායම උපයෝගීකරගෙන බළන්ගොඩ නගරයට අත්‍යාවශ්‍යව පවතින ආදාහනාගාරයක් ඉදිකිරීමට අවශ්‍ය පසුබිම නිර්මාණය කරන බව දන්වමින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

(03) **2010.03.25 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත කිරීම:**

2010.03.25 වන දින පැවැති මාසික මහ සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම්.රූම් මැතිතුමා මැතිතුමා විසින් යෝජනා කරන ලද අතර, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න විසින් ස්ථිර කිරීමෙන් වාර්තාව සභා සම්මත විය.

(04) **පසුගිය සභා වාර්තාව සමාලෝචනය කිරීම:**

වාර්තාව සමාලෝචනය කිරීමක් සිදුනොවීය.

05. **සභාවට ලැබී ඇති ලිපි/පෙත්සම්/පැමිණිලි ආදිය ඉදිරිපත් කිරීම:**

05:01 **ඇල්ලෙපොල පොදු සුසාන භූමිය ශුද්ධ පවිත්‍ර කරගැනීම:**

බළන්ගොඩ නගර සභා බලප්‍රදේශයේ ඇල්ලෙපොල පොදු සුසාන භූමිය ශුද්ධ පවිත්‍ර කිරීම සඳහා ස්ථිර කම්කරුවකු යොදවන ලෙස ඉල්ලා බළන්ගොඩ , ඇල්ලෙපොල,සරස්වතී ජනපද ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

මේ සම්බන්ධව සලකා බැලූ සභාව, ඇස්තමේන්තුවක් සකසා ඒ අනුව මිළ ගණන් කැඳවා ශුද්ධ පවිත්‍ර කිරීමටත් එම මිළ ගණන් පදනම් කරගෙන ඉදිරියට ද එය පවත්වාගෙන යාමට අවසර ලබාදීමට තීරණය කරන ලදී.

05:02 **කාර්යාලීය දුරකථන පද්ධතියේ ගිවිසුම අත්සන් කිරීම:**

මෙම කාර්යාලයේ ස්ථාපනය කර ඇති අභ්‍යන්තර දුරකථන පද්ධතියේ ගිවිසුම් කාලය 2010.05.05 වන දිනෙන් අවසන් වීමට නියමිත වන අතර , නැවත වසරක කාලයක් සඳහා සේවා ගිවිසුම අත්සන් කිරීමට ( 2010.05.05 සිට 2010.05.05 දක්වා ) රු.19500/- ක මුදලක් අයකරන බව දන්වා ස්ටුවටෙල් සමාගමේ කළමනාකරු විසින් එවා ඇති 2010.04.23 දිනැති ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.

මෙම මුදල ගෙවා වසරක කාලයක් සඳහා සේවා ගිවිසුම අත්සන් කිරීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:03 **අක්කර 18 සමගි මාවත වැසිජල කාණුව අවහිර කිරීම:**

ඉහත සඳහන් කරුණට අදාළව ඉදිරිපත් කර තිබූ ලිපියක් සභාගත කරන ලදී.

බළන්ගොඩ අක්කර 18 සමගි මාවත අමරපාල මහතාගේ හා ගුණපාල මහතාගේ ඉඩම අතර වැසි ජල කාණුව අවහිර කිරීමට අදාළව බළන්ගොඩ පොලිස් ස්ථානයේ කරන ලද පැමිණිල්ලි විභාගයේ දී එම කාණුව ඉදිකිරීමට අවශ්‍ය ද්‍රව්‍ය සභාව මගින් ලබාදීමට එකඟවන ලදී. එම ඉදිකිරීමට අදාළව ඇස්තමේන්තුවක් සකස් කල අතර , එහි වටිනාකම රු.94650/- ක් වේ. එම ඇස්තමේන්තුවට අදාළ ද්‍රව්‍ය ලබාදීම සුදුසු බව එමගින් දන්වා තිබිණි.

අදාල ද්‍රව්‍යයන් ලබාදීමට සභාවේ අනුමැතිය පළකරන ලදී.

05:04 **සරස්වතීවත්ත මාර්ගය හා පඩිපෙළ ඉදිකිරීම:**

බළන්ගොඩ නගර සභා බලප්‍රදේශයට අයත් සරස්වතී පාර හා පඩිපෙළ ( එස්.කේ.අශෝධ ධනසිරි මහතා ඇතුළු පිරිස සහ ජේ.ඩබ්.පොඩිසිංඤෝ ඇතුළු පිරිස යන එන මාර්ගය ) සකස් කරදෙන ලෙස ඉල්ලමින් , බළන්ගොඩ , ඇල්ලෙපොල,සරස්වතී පාර අංකඃ 24 දරණ ලිපිනයේ පදිංචි කේ.කේ.ඩබ්.පෙරේරා යන අය විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

ඇස්තමේන්තුවක් සකස් කර එය කර්මාන්ත කමිටුවට වෙත ඉදිරිපත් කර පඩිපෙල 02 ඉදිකිරීමට තීරණය කරන ලදී.

05:05 **ජේ.සී.බී.යන්ත්‍රයේ සේවාව ලබාගැනීම:**

බළන්ගොඩ කිරිඳිගල මැදපාර සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ වැඩ ආරම්භ කර ඇති බැවින් , 2010.04.29 වන දින ජේ.සී.බී.යන්ත්‍රයේ සේවාව ලබාදෙන ලෙස ඉල්ලා කිරිඳිගල ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් විසින් එවා ඇති ලිපියක් සභාගත කරනලදී. ජේ.සී.බී.යන්ත්‍රයේ සේවාව ලබාදීමට සභාව තීරණය කරන ලදී.

05:06 **ගංගාරාම පන්සල අසල මාර්ගය පටුකිරීම:**

ඉහත සඳහන් කරුණු අදාළව මෙගොඩ කිරිඳිගල ප්‍රදේශවාසීන් විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

බළන්ගොඩ ඕළුගන්තොට ගංගාරාම පන්සල අසල මාර්ගය අවහිරවන සේ කොන්ක්‍රීට් කණු සිටුවා කොන්ක්‍රීට් දමා පොළොව සමතලා කර ඇති අතර , අඩි 12 ක් පමණ වු මාර්ගය අඩි තුන දක්වා පටු කර ඇති බැවින් , මේ සම්බන්ධව අවධානය යොමු කර එම මාර්ගය ප්‍රදේශවාසීන්ගේ පාවිච්චිය සඳහා ලබාදෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

ප්‍රාදේශීය ලේකම් වෙත හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු රැස්වීමේ අවධානය මේ සඳහා යොමුකිරීමට සභාව තීරණය කරන ලදී.

05:07 **අංකඃ 113/15 දරණ දේපල තක්සේරු ලේඛනයෙන් ඉවත්කිරීමඃ**

බළන්ගොඩ , රාස්සගල පාරේ අංක ඃ 113/15 දරණ විදුලිබල මණ්ඩලයට අයත් කුඩා කාමරය දැනට වර්ෂ දෙක තුනකට පෙර කඩා ඉවත්කර ඇත. මෙම බිම් කොටස සහිත මුළු ගොඩනැගිල්ල අංකඃ 113/16 යටතේ උළු සෙවිලි කාර්යාලය ලෙස තක්සේරු වී ඇති බැවින් අංකඃ 113/15 දරණ දේපළ තක්සේරු ලේඛනයෙන් ඉවත්කිරිම සුදුසු බව දන්වමින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:08 **අප ජලය පිරිසිදු කිරීමේ පද්ධතියක් සඳහා ( Wet Land ) ඉදිකිරීමේ ව්‍යාපෘතියඃ**

ඉහත සඳහන් කරුණට අදාළව ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

බැංකියවත්ත Night Soil පද්ධතියෙන් මුදාහරිනු ලබන අප ජලය දැනට තිබෙන පද්ධතියෙන් පිරිසිදුවීම සිදුවනුයේ 60% ක ප්‍රමාණයක් වන අතර , ඉතිරි 40% ක ප්‍රමාණය පිරිසිදු කිරීමට Wet Land එකක් ඉදිකිරීම සඳහා සකස්කරන ලද ඇස්තමේන්තුවේ වටිනාකම රුපියල් මිලියන 3.23 කි. එම මුදලින් 80% ක මුදලක් බලශක්ති සංසදයෙන් හා Waste International ආයතනයෙන් ලැබෙන අතර , 20% ක මුදල සභාවෙන් යෙදිය යුතු බැවින් ඒ සඳහා අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලා තිබුණි.

මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:09 **කසල බද්ද ඉවත් කරගැනීමඃ**

ඉහත සඳහන් කාරණයට අදාළව බළන්ගොඩ ලංකා මාතා හෝටලයේ කළමනාකරු විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

එම ඉල්ලීම සලකා බැලු සභාව , දැනට ලංකා මාතා හෝටලය කසල වෙන්කර ලබාදෙනු ලබන බැවින් , එම ආයතනය 2010 වර්ෂයේ අප්‍රේල් මාසය කසල බද්දෙන් නිදහස් කිරීමට සභාව තීරණය කරන ලදී. මෙසේ ඉදිරිපත් කරන ලිපි මින් ඉදිරියට සභාවට ඉදිරිපත් නොකොට එය නිදහස් කිරීම සභාපතිවරයාගේ අනුමැතියට යොමු කිරිම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදී. ඒ සඳහා සභාව විසින් බලය ලබාදීම අනුමත කරන ලදී.

05:10 **බළන්ගොඩ , උඩ ඇල්ලෙපොල,සරස්වතී පාර සුසාන භූමිය ශුද්ධ පවිත්‍රකිරීමඃ**

මෙම නගර සභාවට අයත් උඩ ඇල්ලෙපොල සරස්වතී පාර සුසාන භූමිය නිසි පරිදි ශුද්ධ පවිත්‍රකර පවත්වාගෙන යාම සඳහා මසකට රු.3000/- ක මුදලක් ලබාදෙන ලෙස ඉල්ලමින් , බළන්ගොඩ , රත්නපුර පාර අංකඃ 457 දරණ ලිපිනයේ පදිංචි ජී.උපාලි දයානන්ද මහතා විසින් ඉදිරිපත් කරඇති ලිපියක් සභාගත කරන ලදී.

අදාල මුදල ගෙවා සුසාන භූමිය නඩත්තු කිරීමට සභාවේ අනුමතිය ලබාදෙන ලදී.

05:11 **පාසැල් 3 R සමාජ පිහිටුවීම හා සම්පත් කේන්ද්‍ර 05 ක් ඉදිකිරීමඃ**

ඉහත සඳහන් කරුණට අදාළව ඉදිරිපත් කරඇති ලිපියක් සභාගත කරන ලදී.

පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ අනුග්‍රහය ඇතිව ක්‍රියාත්මක කෙරෙන පාසැල් 3 R සමාජ වැඩ සටහනේ ප්‍රගති වාර්තාව සභා අනුමැතියට ඉදිරිපත් කර ඇති අතර ,

ඒ අනුව 2010 වර්ෂයේ දී මෙම වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් පාසල් 05 අලුතින් තෝරාගෙන ඇත.

01. ර/ ඇල්ලෙපොල මහා විද්‍යාලය
02. ර/ කුමාර විද්‍යාලය
03. ර/ ආනන්ද මෛත්‍රීය ජාතික පාසල
04. ර/බුලත්ගම දෙමළ මහා විද්‍යාලය
05. හින්දු විද්‍යාලය - ඇල්ලෙඅරාව

මෙම ව්‍යාපෘතිය සඳහා සමස්ථ ව්‍යාපෘති පරිව්‍යය රු.මිලියන 4.17 කි. එම මුදලින් මිලියන 2.33 ක් පළාත් පාලන අමාත්‍යාංශයේ ජාතික ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සහායක ව්‍යාපෘතියෙන් ලැබෙන අතර , රුපියල් මිලියන 0.54 ක් නගර සභාවෙන් යෙදිය යුතු බැවින් , ඒ සඳහා අනුමැතිය ඉල්ලා තිබිණ.

මේ සඳහා සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:12 **පළාත් පාලන ආයතන අතර කාර්යසාධන තරඟය - 2009**

උක්ත කරුණට අදාළව සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති 2010.04.26 දිනැති ලිපිය සභාගත කරන ලදී.

2009 වර්ෂය සඳහා පළාත් පාලන ආයතන අතර කාර්ය සාධන තරඟය පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති අතර , මෙම තරඟය සඳහා ඉදිරිපත්වීමේ දී " කාර්ය සාධනය ඉහළ නැංවීම සහ තහවුරු කිරීමේ මෙවලමේ ( PERFECT ) නිර්ණායක පදනම්කරගත යුතුය.

විනිශ්වය මණ්ඩලය පැමිණෙන දින නාගරික ලේකම් ඇතුළු සියළු නිලධාරීන් කාර්යාලයේ රැඳී සිටිය යුතු අතර , මෙම තරඟ විනිශ්වය කටයුතු 2009 සහ 2010 වර්ෂවල සියලු ලිපිගොනු අධීක්ෂණය සඳහා සුදානම් කර තබන ලෙසත් , යම් නිළධරයෙකු/ නිළධාරිනියක හට එදින කාර්යාලයට පැමිණිය නොහැකි වුවහොත් ඔහුගේ / ඇයගේ ලිපිගොනු පරීක්ෂා කිරීමේ දී ඇති දුෂ්කරතාවන්හි සියළු වගකීම සභාවේ ලේකම් වෙත පැවරෙන අතර , 2010.06.20 වන දිනට පෙර තරඟ විනිශ්වය කර ප්‍රතිඵල ලබාදිය යුතු බැවින් කිසිදු හේතුවක් නිසා මෙම දිනයන් සංශෝධනයට ලක්කිරීමට නොහැකි බව අවධාරණය කර ඇත.

තරඟ විනිශ්වව සඳහා පැමිණෙන විනිශ්වය මණ්ඩලය ඔවුන්ගේ දිවා ආහාර රැගෙන එන බැවින් ඔවුනට දිවා ආහාර සැපයීම අවශ්‍ය නොවන බව වැඩිදුරටත් දන්වා තිබුණි.

මේ සම්බන්ධව සභාවේ අවධානය යොමුකල අතර , කාර්ය මණ්ඩලයේ සියළු දෙනා කැඳවා පවතින සියලු අඩුපාඩු නිවැරදි කරගන්නා ලෙසට උපදෙස් ලබාදීමට සභාව තීරණය කරන ලදී.

05:13 **විදේශ සංචාර සඳහා සහා අරමුදලින් වැය දැරීම සීමාකිරීම:**

ඉහත සඳහන් කරුණට අදාළව සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති 2010.04.23 දිනැති ලිපිය සභාගත කරන ලදී.

පළාත් පාලන ආයතනවල මහජන නියෝජිතයින් සහ ලේකම්වරුන් වෙනුවෙන් විදේශ සංචාර සංවිධානය කිරීමට පෞද්ගලික ආයතන කිහිපයක් කටයුතු කරමින් සිටි.

එකී සංවිධායකයින් විසින් ඔවුන්ගේ විවිධ අරමුණු සඳහා මෙම සංචාර සංවිධානය කරන බව නිරීක්ෂණය වි ඇත. එහෙත් පළාත් පාලන ආයතනවල හෝ රාජ්‍ය ආයතනවල අරමුදල් වැයකර විදේශ අධ්‍යයන චාරිකා සඳහා සහභාගී විය යුත්තේ එමඟින් එම ආයතනවලට සෘජු ප්‍රතිලාභ ලැබෙන්නේ නම් පමණක් වන අතර , ජනාධිපති ලේකම් කාර්යාලය මගින්

2006/2/21 දින නිකුත් කල සීඑස්ජ්/2/3/4 චක්‍රලේඛය මගින් ද මේ බව පෙන්වා දී ඇති බව මෙමගින් වැඩිදුරටත් අවධාරණය කර තිබුණි.

ඉහත සඳහන් කරුණු කෙරෙහි සභාවේ අවධානය යොමුකරවන ලදී.

05:14 **<u>පළාත් පාලන ආයතන වල පොදු අරමුදලින් මහජනාධාර ලබාදීම:</u>**

පළාත් පාලන ආයතන වෙතින් මහජනාධාර සහ සුභ සාධන කටයුතු වලට අරමුදලින් වැය දැරීමේ දී නගර සභා ආඥා පනතේ 346 සහ 159 වගන්ති වලින් ද , ප්‍රාදේශීය සභා පනතේ 19 හා 132 වගන්ති වලින් ද පැවරී ඇති බලතල ප්‍රකාර මහජන ආධාර ලබාදීමට පළාත් පාලන ආයතන ප්‍රමුඛත්වය දක්වා ඇතත් , එකී පනත් වලින් පැවරී ඇති අනෙකුත් බලතල ක්‍රියාත්මක කිරීමට සහ වගකීම් ඉටුකිරීමට අඩු නැඹුරුතාවක් දක්වන බව නිරීක්ෂණය වී ඇති බැවින් , අත්‍යාවශ්‍ය අවස්ථාවකදී හැර මහජන ආධාර ලබාදීමට අනුමැතිය සඳහා ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙත ඉල්ලීම් ඉදිරිපත් නොකරන ලෙස දන්වමින් , සබරගමුව පළාත් සභාවේ පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති 2010.04.23 දිනැති ලිපිය සභාවේ දැනගැනීම පිණිස ඉදිරිපත් කරන ලදී.

05:15 **<u>විදුහලේ ආරක්ෂිත බැම්මෙන් කොටසක් ඉදිකරවා ගැනීම:</u>**

ඉහත සඳහන් කරුණට අදාළව ර/බළන්ගොඩ බුද්ධ ජයන්ති මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පති විසින් එවා ඇති 2010.03.30 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ර/ බළන්ගොඩ බුද්ධ ජයන්ති මධ්‍ය මහා විද්‍යාලය වටා ඇති ආරක්ෂිත බැම්මෙන් මීටර් 30 පමණ කොටසක් අත්තිවාරම සමග පෙරළී සම්පූර්ණයෙන් විනාශවී ඇත. මෙම හේතුව නිසා පාසලේ සම්පත් අනාරක්ෂිතවීම හා පාරේ යන එන මගීන්ට ද දැඩි අනාරක්ෂිත තත්ත්වයක් උදා වී ඇති බැවින් , කඩිනමින් මෙම බැම්ම ඉදිකරදෙන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

අනාරක්ෂිත බැම්ම සම්පූර්ණයෙන්ම ගලවා ඉවත්කරගන්නා ලෙසත් , මෙම ඉල්ලීම සබරගමුව පළාත් සභාවේ විෂය භාර ගරු අමාත්‍යතුමන් වෙත යොමුකිරීමට කටයුතු කරන ලෙසත් දැනුම්දීමට සභාව තීරණය කරන ලදී.

05:16 **<u>බළන්ගොඩ සුදර්ශනපුර නිවාස යෝජනා ක්‍රමය:</u>**

බළන්ගොඩ නගර සභාව මගින් 1998 වර්ෂයේ සුදර්ශනපුර නිවාස යෝජනා ක්‍රමය ආරම්භ කල අතර , එම නිවාස යෝජනා ක්‍රමයේ පහල කොටසේ මාර්ගය තාර දමා සකස් කල නමුදු , සැලකිය යුතු කාලයකින් එය නඩත්තු නොකිරීම නිසා , වාහන ගමනා ගමනයට මෙන්ම පාගමනින්වත් යාමට නොහැකි තත්ත්වයකට විනාශ වී ඇත.

මෙම නිවාස යෝජනා ක්‍රමයේ වතුර බැසයාමට කාණු පද්ධතියක් සකස් නොකිරීම නිසා වැසි දිනයන්හි මෙම මාර්ගයේ ගමන් කරන පාසල් සිසුනට ඉමහත් අපහසුතාවකට ලක්වීමට සිදුව ඇත. එසේම මෙම නිවාස යෝජනා ක්‍රමයේ පිහිටි නිවාස 25 ඇත්තේ එකම විථි ලාම්පුවක් වන අතර , වසරේ වැඩි කාලයක් එය අක්‍රීයව පවතී. එබැවින් , මෙම කරුණු කෙරෙහි සභාවේ අවධානය යොමුකරන ලෙස ඉල්ලා කැඳවුම්කරු ඩබ්.ඩබ්.මැක්ස්ස්වර්ත් , යන අය විසින් එවා ඇති 2010.04.28 දිනැති ලිපිය සභාගත කරන ලදී.

දැනට නඩත්තු කටයුතු පමණක් සිදුකරදීමටත් , මුදල් තත්ත්වය සලකා මාර්ගය සකස්කරදීමට ඇස්තමේන්තුවක් සකස් කිරීමටත් සභාව තීරණය කරන ලදී.

05:17 **සෞඛ්‍ය අංශයට අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම:**

සෞඛ්‍ය අංශයට අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය ලබාගැනීම සඳහා සභාවේ අනුමැතිය පතමින් ඉදිරිපත් කරඇති 2010.04.29 දිනැති ලිපිය සභාගත කරන ලදී.

| | |
|---|---|
| 01. 6,7,8,9,10 ප්‍රමාණයේ Gumboots ( Color ) ජෝඩු | 40 |
| 02. Industrial Gloves ජෝඩු | 60 |
| 03. Normal Gloves ජෝඩු | 60 |
| 04. සවල් | 10 |
| 05. Dry bed එක සඳහා කොහු මෙට්ට ( 13'x12' ) | 02 |
| 06. Mask | 50 |

මිළ ගණන් කැඳවා මිළදී ගැනීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:18 **කසල බද්දෙන් නිදහස් කිරීම :**

ඉහත සඳහන් කාරණයට අදාළව බළන්ගොඩ නන්දන හෝටලයේ කළමනාකරු විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

එම ඉල්ලීම සලකා බැලූ සභාව , දැනට නන්දන හෝටලය කසල වෙන්කර ලබාදෙනු ලබන බැවින් , එම ආයතනය 2010 වර්ෂයේ අප්‍රේල් මාසය සඳහා පමණක් කසල බද්දෙන් නිදහස් කිරීමට සභාව තීරණය කරන ලදී.

05:19 **බස්නැවතුම්පල අංක: ඩී.26 දරණ කඩ කාමරය :**

බළන්ගොඩ බස්නැවතුම්පලප ඩී 26 දරණ කඩ කාමරය සඳහා රු.628398/- ක මුදලක් ගෙවා නිමකර ඇති අතර , කඩ කාමරය ව්‍යාපාර කටයුතු සඳහා මෙතෙක් විවෘත කිරීමට නොහැකි වු බැවින් , මේ දක්වා ගෙවීමට ඇති කඩකුළිය හා ඊට අදාළ පොළිය ගෙවීමෙන් නිදහස් කරන ලෙසත් , ගෙවීමට නියමිත ඉතිරි මුදල වන රු.69003/- ක මුදල කොටස් වශයෙන් ගෙවා නිම කිරීමට අවශ්‍ය කටයුතු ඉටුකරදෙන ලෙස ඉල්ලා , බළන්ගොඩ , කල්තොට පාර , අංක: 85/3 දරණ ලිපිනයේ පදිංචි ජනත් එරාන් ද සිල්වා යන අය විසින් එවා ඇති 2010.04.23 දිනැති ලිපිය සභාගත කරන ලදී. ලේකම්වරයාගෙන් මේ ගැන විමස විට ඔහු විසින් එසේ නිදහස් කළ නොහැකි බව සභාව දැනුවත් කරන ලදී.

මේ සම්බන්ධව සලකා බැලූ සභාව, කඩය මෙතෙක් භාර දී නොමැති බැවින් , කඩය ආපසු භාරදුන් දින සිට කඩකුළිය අයකිරීමටත් , ගෙවීමට ඇති පෙර ගෙවීම් මුදල් අයකිරීමටත් තීරණය කරන ලදී.

05:20 **නීතිඥ ගාස්තු ගෙවීම:**

බළන්ගොඩ නගර සභාව හා දේශීය ණය හා සංවර්ධන අරමුදල අතර බේරුම්කරණයේ වෘත්තීමය ගාස්තු වශයෙන් නීතිඥ ඩබ්.දයාරත්න මහතා වෙත 2010.03.26 දිනැති ලංකා බැංකුවේ බළන්ගොඩ ශාඛාවේ අංක :800698 හා 2010.03.31 චෙක්පත මගින් රු.30,000/- ක මුදලක් ගෙවන ලද අතර , ඒ සඳහා සභාවේ ආවරණය අනුමැතිය ලබාදෙන ලෙස ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මේ සඳහා සභාවේ ආවරණය අනුමැතිය ලබාදෙන ලදී.

05:21 **කිරිඳිගල මැදපාර ඉදිකිරීමේ කර්මාන්තය :**

කිරිඳිගල මැද පාර ඉදිකිරීමේ කර්මාන්තය කිරිඳිගල ග්‍රාම සංවර්ධන සමිතිය වෙත කොන්ත්‍රාත් ලබාදෙන ලෙස ඉල්ලා , කිරිඳිගල ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් විසින් එවා ඇති ලිපියක් සභාගත කරන ලදී.

ඉහත සඳහන් මාර්ගය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව කිරිඳිගල ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ලබාදීමට සභාව තීරණය කරන ලදී.

05:22 **ගලි ප්‍රතිකාරක පද්ධතිය සඳහා භාවිත කරනු ලබන කොහුකෙඳි ලබාගැනීමට අදාල රැඳවුම් මුදල ගෙවීම:**

උක්ත කරුණ සම්බන්ධයෙන් තුරුල් සේෆ් එන්වයර්මන්ට් ආයතනය විසින් එවා ඇති 2010.03.15 දිනැති ලිපිය සභාගත කරන ලදී.

ගලි ප්‍රතිකාරක පද්ධතිය සඳහා භාවිත කරනු ලබන කොහුකෙඳි ලබාගැනීම වෙනුවෙන් අදාල රැඳවුම් මුදල ගෙවන ලෙස එමගින් ඉල්ලා තිබිණ.

ගිවිසුම් කාලය අවසන් වී ඇති බැවින් , 10% ක් වන එම මුදල ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

05:23 **බස්නැවතුම්පල පොදු වැසිකිලිය ගාස්තු නිදහස් කිරීම:**

සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය සඳහා 2010.04.14 ,15 යන දිනයන්හි වැසිකිලිය වසා තිබු බැවින් මුදල් අයකිරීමට නොහැකි වු බව දන්වමින් , කොන්ත්‍රාත්කරු , බී.ගුණරත්න මහතා විසින් ඉදිරිපත් කර ඇති ලිපියක් සභාගත කරන ලදී.

මේ සම්බන්ධව සලකා බැලු සභාව , 14 හා 15 යන දිනයන් සඳහා මුදල් අයනොකිරීමට තීරණය කරන ලදී.

06. **මුදල් ගෙවීම් අනුමත කිරීම** ( රු.10,000/- ට වැඩි ගෙවීම් )

( 2010.03.12 සිට 2010.04.23 දක්වා )

## පොදු ගිණුම

| දිනය | විස්තරය | වවුචර් අංකය | චෙක් අංකය | මුදල |
|---|---|---|---|---|
| 2010.03.12 | යශෝධා හාඩ්වෙයාර්<br>බැංකියවත්ත ගලි ප්‍රතිකාරක පද්ධතිය ආවරණය කිරීම කර්මාන්තය වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම | 64 | 654049 | 64600.00 |
| | කැළණි ඒජන්සීස්<br>ජල බවුසර දෙක සඳහා අඟල් 01 හෝස් අඩි 100 මිළදී ගැනීම | 65 | 654050 | 23320.00 |
| | සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය | 66 | 654051 | 122400.00 |

<table>
<tr><td></td><td>බෝම්බුව යතුපිටියාවත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය සඳහා හා තානායම් මායිම් තාප්පය ඉදිකිරීම කර්මාන්තය සඳහා සිමෙන්ති මිටි 170 මිළදී ගැනීම<br>සිමෙන්ති මිටි 170<br>ඒකක මිළ 720.00<br>720x170<br>122400.00</td><td></td><td></td><td></td></tr>
<tr><td>2010.03.15</td><td>සාමාන්‍යාධිකාරී , ලංකා විදුලිබල මණ්ඩලය බැංකියවත්ත කොම්පෝස්ට් ව්‍යාපෘතිය පොහොර හලන මැෂිම සඳහා විදුලිය ලබාගැනීම මුදල් ගෙවීම<br>සේවා රැහැන් ගාස්තු 97054.00<br>ඇප තැන්පත් 1500.00</td><td>69</td><td>654057</td><td>98554.00</td></tr>
<tr><td>2010.03.16</td><td>සාමාන්‍යාධිකාරී ඉඹුල්පේ විවිධ සේවා සමිතිය 2010.02.01 සිට 2010.02.11 දින දක්වා ඉන්ධන බිල පියවීම
<table>
<tr><td>වර්ගය</td><td>ඒකක මිල</td><td>ප්‍රමාණය</td><td>වටිනාකම</td></tr>
<tr><td>ඩීසල්</td><td>73.20</td><td>1275</td><td>93330.00</td></tr>
<tr><td>එන්.ඔයිල්</td><td>323</td><td>4 ලී</td><td>1292.00</td></tr>
<tr><td>එන්.ඔයිල්</td><td>375</td><td>2 ලී</td><td>750.00</td></tr>
<tr><td>ගි.ඔයිල්</td><td>475</td><td>1 ලී</td><td>475.00</td></tr>
<tr><td>ග්‍රීස් 15 කි.ග්‍රෑ</td><td>7125</td><td>01</td><td>7125.00</td></tr>
<tr><td>පැට්‍රල්</td><td>115.20</td><td>15</td><td>1728.00</td></tr>
<tr><td>ටූ.ටී.</td><td>247</td><td>100 මි.ලි</td><td>24.70</td></tr>
<tr><td>ඩී.එස්.කෑන්</td><td>1662</td><td>01</td><td>1662.00</td></tr>
<tr><td></td><td></td><td></td><td>106386.70</td></tr>
</table></td><td>70</td><td>654059</td><td>106386.70</td></tr>
<tr><td>2010.03.16</td><td>ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්<br>2010 පෙබරවාරි මාසයේ දුරකථන බිල පියවීම
<table>
<tr><td>දුරකථන අංකය</td><td>මුදල</td></tr>
<tr><td>2287275</td><td>6216.69</td></tr>
<tr><td>2287153</td><td>4608.45</td></tr>
<tr><td>2286596</td><td>2431.62</td></tr>
<tr><td>2288737</td><td>7260.41</td></tr>
<tr><td></td><td>20517.17</td></tr>
</table></td><td>71</td><td>654060</td><td>20517.17</td></tr>
<tr><td>2010.03.16</td><td>ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්<br>දුරකථන බිල පියවීම
<table>
<tr><td>දුරකථන අංකය</td><td>අදාල මාසය</td><td>මුදල</td></tr>
<tr><td>2287024</td><td>2010/02</td><td>2130.89</td></tr>
<tr><td>3452932</td><td>2010/01</td><td>2738.25</td></tr>
<tr><td></td><td></td><td></td></tr>
<tr><td>3452931</td><td>2010/01</td><td>2247.21</td></tr>
<tr><td></td><td>2009/11<br>2010/02</td><td>3857.02</td></tr>
</table></td><td>72</td><td>654060</td><td>10973.37</td></tr>
</table>

<table>
<tr><td></td><td><table><tr><td></td><td>2009/11<br>2010/02</td><td>3857.02</td></tr><tr><td></td><td></td><td>10973.37</td></tr></table></td><td></td><td></td><td></td></tr>
<tr><td>2010.03.17</td><td>බී.ගුණරත්න<br>2010.03.01 සිට 2010.03.15 දින දක්වා නගරයේ කැලි කසළ එකතු කිරීම හා ප්‍රවාහනය කිරීම සඳහා සේවකයින් යෙදවීම</td><td>74</td><td>654061</td><td>100583.33</td></tr>
<tr><td></td><td>තාවකාලික වැටුප් ගෙවීම - කර්මාන්ත අංශය<br>කර්මාන්ත අංශයේ තාවකාලික කම්කරුවන් සඳහා වැටුප් ගෙවීම<br>පෙට්ටිගල පාර චාරිකා රෙස්ට් 14250<br>ඉදිරිපිට කාණුව ඉදිකිරීම<br>තානායම අලුත්වැඩියාව 133500<br>සමගි මාවත පැති බැම්ම ඉදිකිරීම 1500<br>තානායම ආරක්ෂිත මායිම් වැට 1250</td><td>76-8</td><td>654063</td><td>150500.00</td></tr>
<tr><td>2010.03.22</td><td>ජේ.පී.පී.වික්‍රමසිංහ<br>මහජන පුස්තකාලයට සහා නව කියවීම් ශාලාවට 2010 පෙබරවාරි මාසයේ දිනපතා හා සතිපතා පුවත්පත් සඳහා මුදල් ගෙවීම</td><td>77</td><td>654064</td><td>14640.00</td></tr>
<tr><td>2010.03.22</td><td>සාමාන්‍යාධිකාරී ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>2010.02.18 සිට 2010.02.24 දින දක්වා ඉන්ධන බිල පියවිම<br><table><tr><td>වර්ගය</td><td>එකක මිල</td><td>ප්‍රමාණය</td><td>වටිනාකම</td></tr><tr><td>ඩීසල්</td><td>73.20</td><td>852</td><td>62366.40</td></tr><tr><td>එන්.ඔයිල්</td><td>323</td><td>03 ලී</td><td>969.00</td></tr><tr><td>එන්.ඔයිල්</td><td>446</td><td>02 ලී</td><td>892.00</td></tr><tr><td>පැට්‍රල්</td><td>115.20</td><td>35 ලී</td><td>4032.00</td></tr><tr><td>ටූ.ටී.</td><td>342</td><td>01 ලී</td><td>342.00</td></tr><tr><td>ඩී.එස්.කෑන්</td><td>375</td><td>02</td><td>750.00</td></tr><tr><td>ලේන්සු</td><td>40</td><td>01</td><td>40.00</td></tr><tr><td></td><td></td><td></td><td>69391.40</td></tr></table></td><td>78</td><td>654065</td><td>69391.40</td></tr>
<tr><td></td><td>සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>2010.02.03 සිට 2010.02.17 දක්වා ඉන්ධන බිල පියවීම<br><table><tr><td>වර්ගය</td><td>ඒකක මිළ</td><td>ප්‍රමාණය</td><td>වටිනාකම</td></tr><tr><td>ඩීසල්</td><td>73.20</td><td>574</td><td>42016.80</td></tr><tr><td>එන්.ඔයිල්</td><td>475</td><td>02 ලී</td><td>950.00</td></tr><tr><td>එන්.ඔයිල්</td><td>323</td><td>01 ලී</td><td>323.00</td></tr><tr><td>පැට්‍රල්</td><td>115.20</td><td>49 ලී</td><td>5644.80</td></tr><tr><td>භූමිතෙල්</td><td>51.20</td><td>05 ලී</td><td>256.00</td></tr><tr><td>ටූ.ටී.1/2</td><td>180</td><td>01 ලී</td><td>180.00</td></tr><tr><td>ලේන්සු</td><td>40</td><td>01</td><td>40.00</td></tr><tr><td></td><td></td><td></td><td>49410.60</td></tr></table></td><td>79</td><td>654065</td><td>49410.60</td></tr>
</table>

<table>
<tr><td>2010.03.22</td><td>සිලෝන් පෙට්ට්‍රොලියම් කෝපරේෂන්<br>බළන්ගොඩ නගර සභාව සඳහා 180 ලී තාර බැරල් 15 මිළදී ගැනීම</td><td>80</td><td>654066</td><td>252585.00</td></tr>
<tr><td>2010.03.22</td><td>එල්.ඊ.සී.සී.මෙටල් ක්‍රෂර්<br>ඉදිකිරිම් කටයුතු සඳහා අවශ්‍ය 6"x9" ගල් කියුබ් 07.44 හා 1 1/2 ගල් කියුබ් 01 වෙනුවෙන් ගෙවීම<br><table><tr><td>වර්ගය</td><td>ඒකක මිල</td><td>ප්‍රමාණය</td><td>වටිනාකම</td></tr><tr><td>6x9 ගල්</td><td>2300</td><td>07.44</td><td>17112.00</td></tr><tr><td>1 1/2 ගල්</td><td>4400</td><td>01</td><td>4400.00</td></tr><tr><td></td><td></td><td></td><td>21512.00</td></tr></table></td><td>81</td><td>654067</td><td>21512.00</td></tr>
<tr><td>2010.03.22</td><td>සෙනෙවිරත්න ස්ටෝර්ස්<br>නගරසභාවේ පෙර පාසල සඳහා ප්ලාස්ටික් ළදරු පුටු 50 මිළදී ගැනීම<br>පුටු 01 මිළ 355.00<br>පුටු 50 මිළ 355x50<br>17750.00</td><td>86</td><td>654071</td><td>17750.00</td></tr>
<tr><td>2010.03.22</td><td>තාරුක ඇඩ්වටයිසින් ප්‍රයිවට් ලිමිටඩ්<br>3"x2" ප්‍රමාණයේ කණු දෙක සහිත ඩිජිටල් නාම පුවරු 09 සැකසීම සඳහා ගෙවීම<br>එකක මිල 3250.00<br>නාම පුවරු 09 සඳහා 3250x9<br>29250.00</td><td>87</td><td>654072</td><td>29250.00</td></tr>
<tr><td>2010.03.22</td><td>රිෂානා සර්විස් ස්ටේෂන්<br>ජී.කේ.1483 ට්‍රැක්ටර් රථය පුර්ණ සේවා කිරිම වෙනුවෙන් ගෙවීම</td><td>91</td><td>654073</td><td>15168.00</td></tr>
<tr><td>2010.03.22</td><td>එම්.ජී.පියසේන<br>2010 පෙබරවාරි මාසයේ පෞද්ගලික බස්ගාල් ගාස්තු 135000/- මුදලින් 15% ආපසු ගෙවීම</td><td>92</td><td>654074</td><td>20250.00</td></tr>
<tr><td></td><td>දේශීය ආදායම් කොමසාරිස්<br>2009 දෙසැම්බර් මස අයකරගන්නා ලද ජාතිය ගොඩනැගීමේ බදු මුදල් දේශීය ආදායම් කොමසාරිස් වෙත යැවීම</td><td>93</td><td>654075</td><td>41165.59</td></tr>
<tr><td>2010.03.26</td><td>පළාත් ආදායම් කොමසාරිස්<br>1% පිරිවැටුම් බදු අයකර පළාත් ආදායම් කොමසාරිස් වෙත යැවීම</td><td>96</td><td>654120</td><td>21544.36</td></tr>
<tr><td></td><td>එච්.එල්.පී.ටිම්බර් ඩීලර්ස් ඇන්ඩ් හාඩ්වෙයාර්<br>නගර සභා පෙර පාසල පුළුල් කිරීමේ කර්මාන්තය හා උඩු මහලේ ආරක්ෂක කුටිය ඉදිකිරීම කර්මාන්තය වෙනුවෙන් අවශ්‍ය ඉදිකිරීම් උපාංග මිළදී ගැනිම</td><td>97</td><td>654121</td><td>74568.00</td></tr>
<tr><td>2010.03.26</td><td>ඩබ්.ජේ.එන්.සී.හාඩ්වෙයාර් සහ අයන් වර්ක්ස්<br>බැංකියවත්ත ගලි ප්‍රතිකාරක පද්ධතියේ ටැංකිය ආවරණය කිරීම සඳහා වැඩ කුළිය ගෙවීම</td><td>98</td><td>654122</td><td>34357.00</td></tr>
</table>

<table>
<tr><td></td><td>ජයන්ති ටයර් සෙන්ටර්<br>අංක:226 7521 ටිපර් රථයට 700x6 ටයර් 02 මිළදී ගැනීම<br>ටයර් 01 මිළ 11900.00<br>ටයර් 02 සදහා 11900x2<br>23800.00<br>FLAP 650/700/750/<br>825-16 500.00</td><td>99</td><td>654123</td><td>24300.00</td></tr>
<tr><td></td><td>සෙවන ග්ලාස් හවුස්<br>ළදරු පාසල් ගොඩනැගිල්ල පුළුල් කිරීමේ කර්මාන්තය වෙනුවෙන් අවශ්‍ය 1/2 ප්ලයිවුඩ් බෝඩ් 19 මිළදී ගැනීම<br>බෝඩ් 01 මිළ 1890.00<br>බෝඩ් 19 මිළ 1890x19</td><td>100</td><td>654124</td><td>35910.00</td></tr>
<tr><td>2010.03.26</td><td>හර්ෂණ කලර් සෙන්ටර්<br>වැවේවත්ත පෙර පාසලේ තීන්ත ආලේප කිරීම වෙනුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය ලබාගැනීම</td><td>101</td><td>654125</td><td>39747.82</td></tr>
<tr><td></td><td>සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>2010.01.01 - 2010.01.30 දක්වා ඉන්ධන බිල පියවීම<table><tr><td>වර්ගය</td><td>ඒකක මිළ</td><td>ප්‍රමාණය</td><td>වටිනාකම</td></tr><tr><td>ඩීසල්</td><td>73.20</td><td>493</td><td>36087.60</td></tr><tr><td>පැට්‍රල්</td><td>115.20</td><td>08</td><td>921.60</td></tr><tr><td></td><td></td><td></td><td>37009.20</td></tr></table></td><td>104</td><td>654128</td><td>37009.20</td></tr>
<tr><td>2010.03.30</td><td>සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය සිමෙන්ති මිටි 50 ලබාගැනීම<br>සිමෙන්ති 01 මිළ 720.00<br>සිමෙන්ති 50 මිළ 720x50<br>36000.00</td><td>106</td><td>654130</td><td>36000.00</td></tr>
<tr><td></td><td>ජයන්ති ටයර් සෙන්ටර්<br>ජී.කේ.1483 ට්‍රැක්ටරයට ඇම්පියර් 90 බැටරියක් මිළදී ගැනීම</td><td>109</td><td>54133</td><td>12900.00</td></tr>
<tr><td>2010.03.31</td><td>සභාපති , ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව<br>බළන්ගොඩ නගර සභාවේ නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව සඳහා ඖෂධ මිළදී ගැනීම</td><td>110</td><td>654134</td><td>100000.00</td></tr>
<tr><td></td><td>යශෝධා හාඩ්වෙයාර්<br>තානායම ජල ටැංකිය ඉදිකිරීම වෙනුවෙන් අවශ්‍ය ඉදිකිරීම් උපාංග මිළදී ගැනීම<table><tr><td>වර්ගය</td><td>ඒකක මිළ</td><td>ප්‍රමාණය</td><td>වටිනාකම</td></tr><tr><td>12 මි.මි.සී.එන් කම්බි</td><td>525</td><td>30</td><td>15750.00</td></tr></table></td><td>112</td><td>654136</td><td>18010.00</td></tr>
</table>

<table>
<tr><td></td><td><table>
<tr><td>10 මි.මි.සී.එන් කම්බි</td><td>395</td><td>05</td><td>1975.00</td></tr>
<tr><td>බයින්ඩින්</td><td>165</td><td>01 කි.ග්‍රෑ</td><td>165.00</td></tr>
<tr><td>එච්.පි.තල</td><td>120</td><td>01</td><td>120.00</td></tr>
<tr><td></td><td></td><td></td><td>18010.00</td></tr>
</table></td><td></td><td></td><td></td></tr>
<tr><td>2010.03.31</td><td>සීගිරි ප්‍රින්ටර්ස්<br>කාර්යාලයේ කටයුතවු සඳහා අවශ්‍ය වෙළඳ බලපත්‍ර 1000 හා වවුචර් කොළ ( දෙපිට ලීගල් ) 5000 මුද්‍රණය කිරීම සඳහා<br>වෙළඳ බලපත්‍ර 1000 4500.00<br>වවුචර්පත් 5000 14500.00</td><td>114</td><td>654138</td><td>19000.00</td></tr>
<tr><td></td><td>දේශායි තුෂාර වික්‍රමරත්න<br>රාජකාරී කටයුතු සඳහා අවශ්‍ය න.ස.3 වර්ගයේ බිල්පොත් 200 මුද්‍රණය කිරිම<br>එකක මිළ 175.00<br>පොත් 20 සඳහා 175x200</td><td>116</td><td>654140</td><td>35000.00</td></tr>
<tr><td></td><td>සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමිතිය<br>2010.02.09 සිට 2010.02.27 දින දක්වා ඉන්ධන බිල පියවීම<br><table>
<tr><td>වර්ගය</td><td>ඒකක මිල</td><td>ප්‍රමාණය</td><td>වටිනාකම</td></tr>
<tr><td>ඩීසල්</td><td>73.20</td><td>581</td><td>42529.20</td></tr>
<tr><td>හයිඩ්‍රොලික්</td><td>280.25</td><td>20</td><td>5605.00</td></tr>
<tr><td>පැට්‍රල්</td><td>115.20</td><td>34</td><td>3916.80</td></tr>
<tr><td>භූමිතෙල්</td><td>51.20</td><td>05</td><td>256.00</td></tr>
<tr><td></td><td></td><td></td><td>52307.00</td></tr>
</table></td><td>118</td><td>654141</td><td>52307.00</td></tr>
<tr><td></td><td>කළමණාකරු , ජාතික ජල සම්පාදන මණ්ඩලය<br>2010 මාර්තු මස ජල බිල පියවීම<br>පොදු වෙළඳසැල 13585.60<br>පිංතාලිය 992.32<br>තානායම 3496.40</td><td>119</td><td>654142</td><td>18074.32</td></tr>
<tr><td>2010.03.31</td><td>සභාපති, ර/ ශ්‍රී බුද්ධ ජයන්ති මධ්‍ය මහා විද්‍යාලීය පාසල් සංවර්ධන සමිතිය<br>ප්‍රතිචක්‍රීකරණය කල හැකි කසල මිළදී ගැනීමේ මධ්‍යස්ථානය ඉදිකිරිම<br>10% රැඳවුම් ගෙවීම 26176.81<br>ඇප තැන්පත් 13279.00</td><td>120</td><td>654143</td><td>39455.81</td></tr>
<tr><td></td><td>සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමිතිය<br>සමගි මාවත බැම්ම ඉදිකිරීමේ කර්මාන්තය වෙනුවෙන් අවශ්‍ය සිමෙන්ති මිටි 50 ලබාගැනීම<br>සිමෙන්ති මිටි 01 720.00<br>සිමෙන්ති මිටි 50 720x50</td><td>125</td><td>654146</td><td>36000.00</td></tr>
<tr><td></td><td>ජී.ඩබ්.ඉන්ද්‍රලාල්<br>ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය වැලි කියුබ් 10 ලබාගැනීම</td><td>126</td><td>654147</td><td>40000.00</td></tr>
</table>

<table>
<tr><td></td><td>වැලි කියුබ් 01 මිළ 4000<br>වැලි කියුබ් 10 මිළ 4000x10</td><td></td><td></td><td></td></tr>
<tr><td></td><td>තක්සේරු දීමනා<br>2010 මාර්තු 01 සිට 31 දක්වා නගරසභා බලප්‍රදේශයේ දේපළ තක්සේරු කිරීමේ දී සහයකයින් සඳහා ගෙවීම</td><td>128-3</td><td>654149</td><td>85500.00</td></tr>
<tr><td>2010.03.31</td><td>එල්.එච්.ඩී.ලයනල්<br>බළන්ගොඩ නගර සභාවට අයත් තානායමේ වැඩකිරීම සඳහා යොදා ගන්නා ලද ආයුධ අලුත්වැඩියා කිරීම සඳහා</td><td>129</td><td>654150</td><td>15000.00</td></tr>
<tr><td colspan="5">2010 අප්‍රේල් මාසය</td></tr>
<tr><td>2010.04.02</td><td>සාමාන්‍යාධිකාරී , ලංකා විදුලිබල මණ්ඩලය<br>2010 මාර්තු මස විදුලිබිල පියවීම<br>කාර්යාලය 22275.00<br>නගර සභාවට යාබඳ 265.86<br>ගොඩනැගිල්ල</td><td>01</td><td>186201</td><td>22540.86</td></tr>
<tr><td>2010.04.06</td><td>තාවකාලික වැටුප් කර්මාන්ත අංශය<br>තාවකාලික කම්කරුවන් සඳහා වැටුප් ගෙවීම<br>සමගි මාවත පාර , පැති බැම්ම ඉදිකිරීම<br>තානායම අලුත්වැඩියාව<br>තානායම ආරක්ෂිත වැට හා තාප්පය ඉදිකිරිම<br>කාර්යාලයේ ඩෙස් පුටු මේස අලුත්වාඩියාව<br>බැංකියවත්ත ප්‍රධාන ගේට්ටුව ළඟ පැරණි ගොඩනැගිල්ල නවීකරණය කිරීම<br>කුමාර විද්‍යාලය ඉදිරිපිට කාණුව කොන්ක්‍රීට් කිරීම</td><td>16-1</td><td>186244</td><td>146875.00</td></tr>
<tr><td>2010.04.06</td><td>බලගහමුල සමෘද්ධි සමිතිය<br>බළන්ගොඩ තානායම පිටුපස කොටස වැසි ජලය බැසයාමට ප්‍රධාන කාණුව දක්වා කාණුව ඉදිකිරිමේ අවසන් ගෙවීම</td><td>19</td><td>186246</td><td>251912.38</td></tr>
<tr><td></td><td>බී.ගුණරත්න<br>2010.03.16 සිට 2010.03.31 දින දක්වා නගරයේ කැළි කසළ එකතු කිරීම හා ප්‍රවාහනය කිරීම සඳහා සේවකයින් යෙදවීම</td><td>20</td><td>186247</td><td>100583.33</td></tr>
<tr><td></td><td>තුඹගොඩ ශක්ති ග්‍රාම සංවර්ධන සමිතිය<br>බළන්ගොඩ කල්තොට පාර කුමාරගම 1 පටුමග අවසාන කොටස සංවර්ධනය කිරීම කර්මාන්තයේ 10% රැඳවුම් ගෙවීම 12449.07<br>ගිවිසුම් ඇප තැන්පත් 6300.00</td><td>21</td><td>186248</td><td>18749.07</td></tr>
<tr><td></td><td>ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ්<br>දුරකථන බිල්පත් පියවීම<br>
<table>
<tr><td>දුරකථන අංක</td><td>මාසය</td><td>මුදල</td></tr>
<tr><td>3452939</td><td>2010.02</td><td>3829.46</td></tr>
<tr><td>2288565</td><td>2009.12</td><td>1512.76</td></tr>
<tr><td>3452931</td><td>2010.02</td><td>2543.65</td></tr>
<tr><td>2287022</td><td>2010.02</td><td>3636.81</td></tr>
<tr><td></td><td></td><td>11522.68</td></tr>
<tr><td></td><td></td><td></td></tr>
</table>
</td><td>22</td><td>186249</td><td>11522.68</td></tr>
</table>

<table>
<tr><td>2010.04.06</td><td>එම්.ජී.පියසේන<br>2010 මාර්තු මස පෞද්ගලික බස්ගාල් ගාස්තු තැන්පත් වලින් 15% ආපසු ගෙවීම</td><td>26</td><td>186252</td><td>18000.00</td></tr>
<tr><td></td><td>ර/ බළන්ගොඩ විද්‍යාලෝක මහා විද්‍යාලීය පාසල් සංවර්ධන සමිතිය<br>ප්‍රතිචක්‍රීකරණය කල හැකි කසළ මිළදී ගැනීමෙ මධ්‍යස්ථානය ඉදිකිරීම 10%<br>රැඳවුම් ගෙවීම 26341.81<br>ගිවිසුම් ඇප තැන්පත් 13279.00</td><td>27</td><td>186253</td><td>39620.81</td></tr>
<tr><td></td><td>එල්.එච්.ඩී.ලයනල්<br>බැංකියවත්ත ප්‍රධාන ගොඩනැගිල්ල අසල ගොඩනැගිල්ල නවීකරණය කිරීම කර්මාන්තයේ වැඩ කුළිය ගෙවීම</td><td>28</td><td>186254</td><td>18070.00</td></tr>
<tr><td></td><td>සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමුපකාර සමිතිය<br>2010.03.01 සිට 2010.03.06 දක්වා ඉන්ධන බිල පියවීම<br><table><tr><td>වර්ගය</td><td>ඒකක මිළ</td><td>ප්‍රමාණය</td><td>වටිනාකම</td></tr><tr><td>ඩීසල්</td><td>73.20</td><td>679</td><td>49702.80</td></tr><tr><td>එන්.ඔයිල්</td><td>375</td><td>01 ලී</td><td>375.00</td></tr><tr><td>පැට්‍රල්</td><td>115.20</td><td>32 ලී</td><td>3686.40</td></tr><tr><td>භූමිතෙල්</td><td>51.20</td><td>10</td><td>512.00</td></tr><tr><td></td><td></td><td></td><td></td></tr></table></td><td>29</td><td>186255</td><td>54276.20</td></tr>
<tr><td></td><td>තාවකාලික වැටුප් ගෙවීම<br>බැංකියවත්ත ප්‍රධාන ගේට්ටුව අසල<br>ගොඩනැගිල්ල නවීකරණය 6000.00<br>තානායම අලුත්වැඩියාව 30500.00<br>කාර්යාල ගේට්ටුව අලුත්වැඩියාව 2250.00</td><td>30-1</td><td>186256</td><td>38750.00</td></tr>
<tr><td>2010.04.19</td><td>ජී.ඩබ්.ඇන්තනි<br>නගර සභාවට අයත් කසළ කරත්තය අලුත්වැඩියා කිරීම</td><td>31</td><td>186257</td><td>12700.00</td></tr>
<tr><td></td><td>එච්.සී.ඩී.වසන්ත කුමාර<br>නගර සභාව සඳහා ගල් කියුබ් 27.20 නගර සභාව වෙත ප්‍රවාහනය කිරීම<br>ගල් කියුබ් 01 සඳහා 900.00<br>ගල් කියුබ් 27.20 සඳහා 900x27.20</td><td>33</td><td>186259</td><td>24480.00</td></tr>
<tr><td></td><td>එල්.ජී.සී.සී.මෙටල් ක්‍රෂර්<br>ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය ගල් ලබාගැනීම<br><table><tr><td>වර්ගය</td><td>ඒකක මිළ</td><td>ප්‍රමාණය</td><td>වටිනාකම</td></tr><tr><td>6x9</td><td>2300</td><td>10</td><td>23000.00</td></tr><tr><td>6x9</td><td>2300</td><td>2.22</td><td>5106.00</td></tr><tr><td>1 1/2</td><td>4400</td><td>01</td><td>4400.00</td></tr><tr><td>ප්‍රවාහනය</td><td></td><td></td><td>900.00</td></tr><tr><td></td><td></td><td></td><td></td></tr></table></td><td>37</td><td>186262</td><td>33406.00</td></tr>
<tr><td>2010.04.21</td><td>ඩැක්ස් ඉංජිනියරින් කම්පැණි ප්‍ර.ලි<br>බොබ් කැට් යන්ත්‍රයේ මීටර් පැය 2000 සේවාව වෙනුවෙන් මුදල් ගෙවීම</td><td>41</td><td>186266</td><td>116537.73</td></tr>
</table>

<table>
<tr><td></td><td>ජේ.ජී.පි.වික්‍රමසිංහ<br>මහජන පුස්තකාලයට සහ නව කියවීම් ශාලාවට 2010 මාර්තු මාසයේ පුවත්පත් සැපයීම වෙනුවෙන් ගෙවීම</td><td>44</td><td>186269</td><td>16250.00</td></tr>
<tr><td></td><td>සාමාන්‍යාධිකාරී , ඉඹුල්පේ විවිධ සේවා සමිතිය<br>2010.03.12 සිට 2010.03.17 දක්වා ඉන්ධන බිල පියවීම
<table>
<tr><td>වර්ගය</td><td>ඒකක මිළ</td><td>ප්‍රමාණය</td><td>වටිනාකම</td></tr>
<tr><td>ඩීසල්</td><td>73.20</td><td>591</td><td>43261.20</td></tr>
<tr><td>එන්.ඔයිල්</td><td>375.00</td><td>01</td><td>375.00</td></tr>
<tr><td>පැට්‍රල්</td><td>115.20</td><td>24</td><td>2764.80</td></tr>
<tr><td>ඩී.එස්.කෑන් 10 ලී</td><td>6460</td><td>01</td><td>6460.00</td></tr>
</table></td><td>45</td><td>186270</td><td>52861.00</td></tr>
<tr><td></td><td>බළන්ගොඩ ඉලෙක්ට්‍රිකල්ස්<br>බළන්ගොඩ නගර සභාවේ විදුලි ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය විදුලි උපාංග ලබාගැනීම</td><td>46</td><td>186271</td><td>32783.00</td></tr>
<tr><td></td><td>සිටි ඉලෙක්ට්‍රිකල්ස්<br>තානායමේ විදුලි අලුත්වැඩියාවන් වෙනුවෙන් අවශ්‍ය විදුලි උපාංග ලබාගැනීම</td><td>47</td><td>186272</td><td>16995.00</td></tr>
<tr><td>2010.04.21</td><td>බී.ගුණරත්න<br>2010.04.01 සිට 2010.04.15 දක්වා බළන්ගොඩ නගරයේ කැළිකසල එකතු කිරීම හා ප්‍රවාහනය කිරීම සඳහා සේවකයින් යෙදවීම</td><td>48</td><td>186273</td><td>100583.33</td></tr>
<tr><td></td><td>ර/ සී.සී.දෙමළ මහා විද්‍යාලය<br>පාසල් සංවර්ධන සමිතිය<br>ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කසල මිළදී ගැනීමේ මධ්‍යස්ථානය ඉදිකිරීමේ<br>10% රැඳවුම් ගෙවීම 26201.31<br>තැන්පත් 13279.00</td><td>49</td><td>186274</td><td>39480.31</td></tr>
<tr><td>2010.04.23</td><td>දේශීය ආදායම් කොමසාරිස්<br>2010 ජනවාරි පෙබරවාරි මාසයේ රඳවා ගැනීමේ බදු මුදල් දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කිරීම</td><td>50</td><td>186275</td><td>103424.63</td></tr>
<tr><td></td><td>පළාත් ආදායම් කොමසාරිස්<br>2010 ජනවාරි පෙබරවාරි මාසයේ පිරිවැටුම් බදු මුදල් පළාත් ආදායම් කොමසාරිස් වෙත යැවීම</td><td>51</td><td>186276</td><td>14624.91</td></tr>
<tr><td colspan="5">2010.03.17 සිට 2010.04.06 - ලංකා බැංකුව</td></tr>
<tr><td>2010.03.17</td><td>කළමණාකරු, මහජන බැංකුව , බළන්ගොඩ<br>ලංකා බැංකුවේ අංක:5947660 ගිණුමෙන් මහජන බැංකුවේ අංක:6351750 ගිණුමට මුදල් මාරුකිරීම</td><td>06</td><td>806695</td><td>1000000.00</td></tr>
<tr><td>2010.03.22</td><td>දේශීය ආදායම් කොමසාරිස්<br>2009 දෙසැම්බර් මස අයකර ගන්නා ලද ජාතිය ගොඩනැගීමේ බදු මුදල් දේශීය ආදායම් කොමසාරිස් වෙත යැවීම</td><td>07</td><td>800696</td><td>25961.52</td></tr>
</table>

| | | | | |
|---|---|---|---|---|
| 2010.03.26 | ලංකා පොස්පේට් ලිමිටඩ්<br>රොක් පොස්පේට් ටොන් 07 ක් මිළදී ගැනීම | 08 | 800697 | 53200.00 |
| 2010.03.31 | ඩබ්.දයාරත්න<br>නගර සභාව හා දේශීය ණය සංවර්ධන අරමුදල අතර බේරුම්කරණය සඳහා වෘත්තීමය ගාස්තුව අයකිරීම | 10 | 800698 | 30000.00 |
| | ජාතික ජල සම්පාදන මණ්ඩලය<br>2010 මාර්තු මස ජල බිල්පත පියවීම<br>නව බස්නැවතුම්පල | 11 | 800699 | 49114.00 |
| 2010.04.06 | කළමණාකරු, ලංකා විදුලිබල මණ්ඩලය<br>නව බස්නැවතුම්පලේ 2010 මාර්තු මාසයේ විදුලි බිල පියවීම | 01 | 800700 | 68690.40 |

ඉහත සඳහන් මුදල් ගෙවීම් සියල්ල අනුමත කිරීමට සභාව තීරණය කරන ලදී.

07 **ඇස්තමේන්තු අනුමත කිරීම:**

ඇස්තමේන්තු කිසිවක් සභා අනුමැතියට ඉදිරිපත් කරනොතිබුණි.

**08.1 යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ :**

නැත

**යථා පරිදි කල් දී ඇති යෝජනා :**

නැත.

**09. ටෙන්ඩර් හා මිළ ගණන් සලකා බැලීම**

**09:01 ක්‍රීඩා උපකරණ මිළදී ගැනීම - නගර සභා පෙර පාසැල:**

නගර සභා පෙර පාසැලට ක්‍රීඩා උපකරණ ලබාගැනීම රු.450228.80 ක් වටිනා ඉන්වොයිස්පත ඉදිරිපත් කර ඇති බැවින් , එම මුදල ගෙවීමට සභාවේ අනුමැතිය ඉල්ලා තිබිණි.

අදාල මුදල ගෙවීමට සභාවේ අනුමැතිය ලබාදෙන ලදී.

09:02 **බස්නැවතුම්පල විවේක කාමරය ආයුර්වේදය ලෙස සංවර්ධනය කිරීම**

බළන්ගොඩ බස්නැවතුම්පල විවේක කාමරය ආයුර්වේදය ලෙස සංවර්ධනය කිරීම කර්මාන්තයේ රෝල ෂටර් දොරක් සපයා සවිකිරීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර , අදාල මිළ ගණන් පහත දැක්වේ.

| ආයතනය | මිළ ගණන |
|---|---|
| 01. ඩබ්.ඒ.එන්.සී.හාඩ්වෙයාර් සහ අයන් වර්ක්ස් , වැගපිටිය, මොරහැල,බළන්ගොඩ | 56900/- |
| **02. සෑම් ඩෑම් කන්ස්ට්‍රක්ෂන් කම්පැණි ප්‍රයිවට් ලිමිටඩ්** | **54250/-** |
| 03. නිව් සතිරෝ ඉන්ඩස්ට්‍රීස් , රත්නපුර පාර, මාවෙල,අවිස්සාවේල්ල | 55400/- |

මෙම මිළ ගණන් අතුරින් අවම මිළ ඉදිරිපත් කර ඇති සෑම් ඩෑම් කන්ස්ට්‍රක්ෂන් කම්පැණි ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයෙන් අදාල සේවාව ලබාගැනීමට සභාව තීරණය කරන ලදී.

09:03 **226-7521 ටිපර් රථය අළුත්වැඩියා කිරීම:**

ඉහත අංක දරණ වාහනයේ ටිපර් කරන ජැක් එක අලුත්වැඩියා කිරීමට ඩිපෝ ඉංජිනේරුවරයාගෙන් ලබාගත් වාර්තාව සභාගත කරන ලදී.

පාවිච්චි කළ වාහනයක් බැවින් , මිළ ගණන් කැඳවා වගකීම් සහිත සහතිකයක් මත සවිකිරීමට තිරණය කරන ලදී.

09:04 **ජල මෝටරයක් මිළදි ගැනීම:**

සුදර්ශනපුර ජල ව්‍යාපෘතිය සඳහා ජල ටැංකියක් මිළදී ගැනීමට ලබාගත් මිළ ගණන් සභාවට ඉදිරිපත් කරන ලදී.

| **වතුර මෝටරයේ වර්ගය** | **දේශානී හාඩ්වෙයාර්** | **නිව් හැපි ස්ටෝර්ස්** | **ලංකා කොමඩිටි එක්ස්චේන්ජ් පුද් සමාගම** | **ටී සිලෝන් ඉන්වෙස්ට්මන්ට් පුද්.සමාගම** | **කැළණි ඒජන්සීස්** |
|---|---|---|---|---|---|
| Solex Sxmiioo/32" වතුර මෝටරය | රු.8400/- | රු.83000/- | රු.80100/- | රු.80100/- | රු.79500/- |

ඉහත සඳහන් මිළ ගණන් අතුරින් කැළණි ඒජන්සීස් ආයතනයේ අවම මිළ පිළිගත් සභාව , ඇස්තමේන්තුව අනුව බට , මෝටරය, ටැංකි කුළුණ සකස් කරදීමට තීරණය කරන ලදී .

09:05 **227-5020 ගලි බවුසරයට ටයර් මිළදී ගැනීම:**

මෙම නගර සභාව සතු අංක: 227-5020 ගලි බවුසරයේ පිටුපස ටයර් 04 ක් ( 700x16 ප්‍රමාණයේ ) මිළදීගැනීමට මිළ ගණන් කැඳවන ලද අතර , ලබාගත් මිළ ගණන් පහත දැක්වේ.

| රෙන්බෝ ටයර් සර්විස් | සිටි ටයර් සර්විස් | ජයන්ති ටයර් සෙන්ටර් | බළන්ගොඩ ටයර් සෙන්ටර් | ඩිනේෂ් ටයර් සර්විස් |
|---|---|---|---|---|
| 56400/- | 56000/- | 55600/- | 56800/- | 55900/- |

ඉහත සඳහන් මිළ ගණන් අතුරින් ජයන්ති ටයර් සෙන්ටර් ආයතනයේ අවම මිළ ගණන පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

09:06 **56/1906 කෘෂ කැබ් රථය අළුත්වැඩියා කිරීම:**

කෘෂ කැබ් රථයේ ඕල්ටනේටරය අලුත්වැඩියා කිරීම සඳහා මිළ ගණන් කැඳවන ලදී. එම මිළ ගණන් පහත දැක්වේ.

| නිව් දයානන්ද මෝටර්ස් | තරංග මෝටර්ස් | චමින්ද මෝටර්ස් |
|---|---|---|
| රු.21450/- | රු.21700/- | රු. 20250/- |

ඉහත සඳහන් මිළ ගණන් අතුරින් චමින්ද මෝටර්ස් ආයතනයේ අවම මිළ ගණන පිළිගැනීමට සභාව තීරණය කරන ලදී.

10. **යෝජනා :**

10:01 **ගරු නාගරික මන්ත්‍රී , ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා**

බළන්ගොඩ රාස්සගල පාරේ දෙමළ විදුහල් මාවතේ වතුර බැසයන කාණුව සකස් කරන ලෙස ඉල්ලා සිටින ලදී. මේ සඳහා ඇස්තමේන්තුවක් සකස් කර ඒ අනුව අදාළ කාර්යය සිදුකිරීමට සභාව තීරණය කරන ලදී.

10:02 **ගරු නාගරික උපසභාපති , සුමේද චමින්ද බස්නායක මැතිතුමා :**

බළන්ගොඩ උඩ ඇල්ලෙපොල තලාව පාර ඉතිරි කොටස සංවර්ධනය කරන ලෙස ඉල්ලා සිටින ලදී.

11. **කාරක සභා වල වාර්තා සලකා බැලීම:**

බළන්ගොඩ මහජන පොළ ඉදිකිරීම පළමු අදියර හා පොළව කොන්ක්‍රීට් කිරීම සම්බන්ධ 2010.03.31 වන දින මෙම නගර සභාවේ පැවති සාකච්ඡාවේ වාර්තාව ,සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ කමිටු වාර්තාව ද , 2010.04.26 වන දින පැවති සෞඛ්‍ය හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ විශේෂ කමිටු වාර්තාව ද, 2010.04.27 වන දින පැවති කර්මාන්ත කමිටු රැස්වීමේ වාර්තාව ද සභාගත කරන ලදි.

එම වාර්තාවන් අධ්‍යයනය කල සභාව එම වාර්තාවන් අනුමතකරන ලදී.

12. **ආදායම් - වියදම් හා අනෙකුත් වාර්තා ඉදිරිපත් කිරීම:**

2010 වර්ෂයේ මාර්තු මාසයට අදාළ ආදායම් හා වියදම් පිළිබඳ වාර්තාව සභාවට ඉදිරිපත් කර තිබුණි.

| | |
|---|---|
| පුනරාවර්ථන ලැබීම් | 9,973,895.29 |
| වෙනත් ලැබීම් | 1,951,893.98 |
| | ----------- |
| මුළු ලැබීම් | 11,925,789.27 |

| | |
|---|---|
| පුනරාවර්ථන වියදම් | 3,677,926.00 |
| වෙනත් වියදම් | 3,326,333.12 |
| | -------------- |
| මුළු වියදම් | 7,004,259.52 |

මෙම ආදායම් හා වියදම් වාර්තාව සභාව විසින් අනුමත කරන ලදී.

12:02 2010. 02.01 දින සිට 2010.02.27 දින දක්වා මෙම නගර සභාව සතු වාහන සඳහා වැය වු ඉන්ධන පිළිබඳ වාර්තාවක් සභාවට ඉදිරිපත් කරන ලදී.

අංකඃ ND-5124 දරණ වෑන් රථයට වැය වී ඇති ඉන්ධන ප්‍රමාණය පිළිබඳව නැවත පරීක්ෂාකර වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දැන්වීමට තීරණය කරන ලදී. අදාළ ඉන්ධන වියදම් වාර්තාව අනුමත කරන ලදී.

13. **වෙනත් කරුණු ඃ**

13:01 **ගරු නාගරික මන්ත්‍රී - ඩබ්.විමලසේන වැවේගෙදර මැතිතුමාඃ**

ගරු මන්ත්‍රීතුමා කථා කරමින් , ඇල්ලෙපොල වැවේගෙදර මාර්ගයේ පැති බැම්ම කඩා වැටීම නිසා ඇල මාර්ග අවහිර වී කුඹුරු අක්කර 02 ක් පමණ පුරන් වී ඇති බව පැවසීය. එබැවින් , මේ සම්බන්ධව විශේෂ අවධානය යොමු කර හැකි ඉක්මණින් එම පැති බැම්ම හා බෝක්කුව සකස් කරදෙන ලෙස ඉල්ලා සිටින ලදී.

පසුගිය දා පැවති පාර්ලිමේන්තු මහා මැතිවරණයේ දී බළන්ගොඩ ආසනයට එක්සත් ජාතික පක්ෂයෙන් වසර 16 පසුව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස රන්ජන් රාමනායක මැතිතුමා පත්ව ඇති බැවින් , ඒ සම්බන්ධව සිය සතුට පළකරන ලදී. , එතුමාට බළන්ගොඩ නගර සභාවේ සුභාශිංසනය පළකර යවන ලෙස යෝජනා කරන ලදුව, එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී , යූ.එච්.ගාමිණී මැතිතුමා විසින් ස්ථිර කරන ලදී. , රන්ජන් රාමනායක මැතිතුමාගේ ජයග්‍රහණය වෙනුවෙන් ඡන්දය ප්‍රකාශ කල ජනතාවට සිය ස්තුතිය පිරිනමන බව වැඩිදුරටත් සඳහන් කරමින් සිය අදහස් දැක්වීම නිමකරන ලදී.

13:02 **ගරු නාගරික මන්ත්‍රී , ඊ.ඒ.ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමාඃ**

මෙම දිනවල පවතින අධික වර්ෂාව හේතුවෙන් නගර සභා බලප්‍රදේශයේ ඇතැම් මාර්ග සෝදාපාළුවට ලක්ව මාර්ග කැලෑ වැවී ඇති බැව් පැවසීය. දෛනික පදනම මත හෝ කම්කරුවන් යොදවාගෙන එම මාර්ග සංවර්ධනය කර දෙපස ශුද්ධ පවිත්‍ර කරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා මෙන් ඉල්ලීමක් කරන ලදී.

වැඩිදුරටත් කථා කල ගරු මන්ත්‍රීතුමා , සබරගමුව පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරවර සිටි මොහාන් එල්ලාවල මැතිතුමා අභාවප්‍රාප්ත වී මැයි මස 07 වන දිනට වසරක් සපිරෙන බව දැන්වීය. එතුමා බළන්ගොඩ ප්‍රදේශයට පමණක් නොව සබරගමුව පළාතටම සිදුකල අමිල මෙහෙවර ප්‍රශංසාත්මකව සිහිපත් කරන අතර , ඒ සම්බන්ධව සිය ගෞරවය එතුමන් වෙත පළකරන බව පැවසීය. එතුමා සිහිවීම පිණිස බළන්ගොඩ ඔරලෝසු කණුව අසල සිට දොරවෙල නව අතුරු මාර්ගය හපුතලේ පාරට වැටෙන හන්දිය දක්වා වු කොටස " **මොහාන් සාලිය එල්ලාවල මාවත "** නම් කර මැයි මස 07 වන දිනට එම දැන්වීම් පුවරුව නිරාවරණය කරන ලෙසට යෝජනා කරන ලදී. එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

13:03 **ගරු නාගරික මන්ත්‍රී, එම්.ටී.එම්.රුමී මැතිතුමා ඃ**

ගරු මන්ත්‍රීතුමා අදහස් දක්වමින් , බළන්ගොඩ , ගොරොක්ගහමඩ මාර්ගයේ කාණු පද්ධතියේ වැලි එකතුවීම නිසා කාණු අවහිර වි වර්ෂා කාලයේ දි ජලය පිටාර ගැලීමට ලක්වන අතර , ඒ ආසන්නයේ ඇති මෙම සභාවට අයත් කිරිමණ්ඩලය ඉදිරිපිට හා අක්කර 18 මාර්ගය ද ඛාදනයට ලක්ව ඇති බව දැන්වීය. ( මේ සම්බන්ධව මාර්ග සංවර්ධන අධිකාරියේ අවධානය යොමු කරවීමට තීරණය කරනලදී. ) කුමාරගම ii පටුමග සංවර්ධනය කිරීමට අවශ්‍ය මුල්‍ය ප්‍රතිපාදන ලබාදීම සම්බන්ධව ගරු සභාපතිතුමා , ලේකම්තුමා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයට සිය ස්තුතිය පිරිනමන බව දැන්වීය. කුමාරගම ප්‍රදේශයේ පන්සල දක්වා වු කොටසේ ජීවත්වන

ජනතාවට පානීය ජලය ලබාදීම සඳහා සභාව මගින් ජලනල ප්‍රමාණය ලබාදෙන ලෙස ඉල්ලීමක් කරන ලදී.

වැඩිදුරටත් කථා කල ගරු මන්ත්‍රීතුමා , පසුගිය දා පැවති පාර්ලිමේන්තු මහා මැතිවරණයට බළන්ගොඩ ආසනය වෙනුවෙන් එක්සත් ජනතා නිදහස් සංධානවෙන් සබරගමුව පළාත් සභාවේ පළාත් සභා මන්ත්‍රී හානු මුණිප්‍රිය මැතිතුමා ඉදිරිපත් වු අතර , එතුමාට ජයග්‍රහණය කිරීමට අවස්ථාව නොලැබුණු බව පැවසීය. ඒ සම්බන්ධව සිය කණගාටුව ප්‍රකාශ කරන අතර , ඉදිරියේ දී එතුමාට සබරගමුව පළාත් සභාවේ අමාත්‍යධුරයක් ලැබෙනු ඇතැයි දැනගැනීමට ලැබී ඇති බැවින් ඒ සඳහා වාසනාව උදා වේවායි තමන් සුභප්‍රාර්ථනය කරන බව දැන්වීය.

එක්සත් ජාතික පක්ෂයෙන් බළන්ගොඩ ආසනයට රන්ජන් රාමනායක මහතා සහ සමන්රත්නායක මහතා අපේක්ෂකයින් ලෙස ඉදිරිපත් වු අතර , රන්ජන් රාමනායක මැතිතුමා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තේරීපත් වු බව පැවසීය. එතුමා බළන්ගොඩ ප්‍රදේශයේ පදිංචි අයෙකු නොවන නිසා එතුමාට ප්‍රදේශයේ ජනතාවගේ ඉල්ලීම් යෝජනා ආදිය සම්බන්ධව පුළුල් අවබෝධයක් තිබේදැයි සිතිය නොහැකි බව පැවසීය. සමන් රත්නායක මහතා ප්‍රදේශයේ පදිංචි අයෙකු නිසා ඒ මහතා එම ධුරයට පත්වුයේ නම් ඒ සම්බන්ධව බළන්ගොඩ ජනතාවට සතුටුවිය හැකි බව පැවසීය. එසේම රන්ජන් රාමනායක මැතිතුමාට සුභාශිංසනය පළකිරීමේ යෝජනාව එක්සත් ජාතික පක්ෂය හරහා යැවීමට පියවර ගන්නා ලෙස ගරු නාගරික මන්ත්‍රී ඩබ්.විමලසේන මැතිතුමාගෙන් ඉල්ලීමක් කරන බව පැවසීය.

ඉදිරි පළාත් පාලන මැතිවරණය කොට්ඨාස ක්‍රමයට පැවැත්වීමට රජය තීරණය කර ඇති බව දන්වමින් සිය අදහස් දැක්වීම නිමකරන ලදී.

13:04 **<u>ගරු නාගරික මන්ත්‍රී , එම්.නිමල් කරුණාරත්න මැතිතුමා :</u>**

ජාතික සවිය ගමනැගුම වැඩ සටහනේ පළමු අදියර යටතේ ඇල්ලෙඅරාව ප්‍රදේශයට ජලබාදීමේ සංවර්ධන ව්‍යාපෘතිය නිමකිරීමට නොහැකි වු බැවින් නාකැටිය ප්‍රදේශයේ ජනතාවට ජලය ලබාදීමට නොහැකිව තිබෙන හෙයින් , ජලනල හා මෝටර් 02 ක් සභා අරමුදලෙන් ලබාදෙන ලෙස ඉල්ලීමක් කරන ලදි.

( මෙම සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ලැබුණු මුදල් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවුනු නිසා ගම නැගුම වැඩ සටහන ii අදියර යටතේ ලක්ෂ 05 ක මුදලක් වෙන්කරදෙන ලෙස ප්‍රාදේශීය ලේකම් ඉඹුල්පේ වෙත දැණුම්දීමට තීරණය කරන ලදී.)

13:04 **<u>ගරු නාගරික මන්ත්‍රී, ධර්මසේන සමරසිංහ මැතිතුමා :</u>**

ගරු මන්ත්‍රීතුමා කථ කරමින් , බළන්ගොඩ දෙවට පාර ශුද්ධ පවිත්‍රකරදෙන ලෙසත් , එම මාර්ගය ආරම්භයේ සිට මීටර් 200 ක් දුරින් හා , එම විදුලි කණුවේ සිට මීටර් 200 ක් දුරින් තවත් විදුලි කණුවක් සිටුවන ලෙස විදුලිබල මණ්ඩලයෙන් ඉල්ලීමක් කිරීමට පියවර ගන්නා ලෙස ඉල්ලා සිටින ලදී.

වැඩිදුරටත් අදහස් දැක් වු ගරු මන්ත්‍රීතුමා , පාර්ලිමේන්තු මහා මැතිවරණය පවත්වා ප්‍රතිඵල නිකුත්ව ඇති අතර එක්සත් ජනතා සංධානයට අතිවිශිෂ්ඨ ජයක් ලැබී ඇති බව සඳහන් කරන ලදී. මෙවර ද බළන්ගොඩ ආසනයට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු පත්කරගැනීමේ නොහැකිවීම කණගාටුවට කාරණාවක් බව පැවසු ගරු මන්ත්‍රීතුමා , සබරගමුව පළාත් සභාවේ ගරු පළාත් සභා මන්ත්‍රී හාණු මුණිප්‍රිය මැතිතුමා පාලිමේන්තු මහා මැතිවරණය සඳහා අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් වු අතර , එතුමාට ජයග්‍රහණය කිරීමට නොහැකි වු බවත් , නමුත් සබරගමුව පළාත් සභාවේ අමාත්‍යධුරයක් එතුමන් වෙත ලබාදෙන බවට දැනගැනීමට ඇති බැවින් ,එය ප්‍රදේශයේ සංවර්ධනයට විශාල ශක්තියක් වනු ඇතැයි පැවසිය.

ගරු පේෂකර්ම අමාත්‍ය මහින්ද රත්නතිලක මැතිතුමා බළන්ගොඩ ආසනයේ සංවර්ධනය සඳහා විශාල දායකත්වයක් ලබාදුන් අතර , එතුමා කල සේවයට කෘතගුණ දන්නා පිරිස එතුමන් වෙත ඡන්දය ප්‍රකාශ කර ඇති බවත් දැන්වීය. මනාප ක්‍රමයට වඩා කොට්ඨාස ක්‍රමය හොඳ බව ගරු මන්ත්‍රීවරුන් ප්‍රකාශ කලද බලය නිසා ලැබෙන වරම ( " වරදාන වරප්‍රසාද " ) නිසා එකම පක්ෂයේ අය අතර මදභේද පවතින අතර , වත්මන් රජය තුළ ද එම තත්ත්වය තිබෙන බව පැවසීය. කෙසේ වෙතත් , රට ආදර්ශයක් ලබාදෙන ගරු මැති ඇමතිවරුන් පිරිසක් සිටින බැවින් ඔවුන්ගේ කටයුතු අපි අගය කලයුතු බව දැන් වූ ගරු මන්ත්‍රීතුමා, පරිසර අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා හා ප්‍රවාහන අමාත්‍යව සිටි ඩලස් අලහපෙරුම යන ගරු අමාත්‍යවරුන් ජනතාවට ආදර්ශමත් සේවාවක් ඉටුකර ඇත. එම නිසා මෙවර ද එතුමන්ලා දෙදෙනා වෙත ඉතා හොඳ අමාත්‍ය ධූරයන් දෙකක් ලැබී ඇති බැවින් මෙම දේශයට ආශ්චර්යමත් සේවාවක් ඉටුකිරීමට හැකිවනු ඇති බැව් සඳහන් කරන ලදී.

13:05 **ගරු නාගරික මන්ත්‍රී , ඩබ්.ඒ.වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා:**

2010 වර්ෂයේ ගමනැගුම වැඩ සටහන යටතේ තුඹගොඩ සුනිල් ගරාජය අසලින් ඇති මාර්ගය හා හුණුකුඹුර මාර්ගය සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ වැඩ අවසන් කර ඇති බැවින් , ලබන මස 08 වන දින සවස 04.00 ට එම මාර්ග ජනතා අයිතියට පැවරීමට සියළු කටයුතු සංවිධානය කර ඇති බැවින් , එම අවස්ථාවට සහභාගීවන ලෙස ගරු මන්ත්‍රීවරුන් සියළු දෙනාටම ආරාධනය කරන බව පැවසීය.

බළන්ගොඩ ආසනයට එක්සත් ජාතික පක්ෂයෙන් රන්ජන් රාමනායක මැතිතුමා පත්වීම සම්බන්ධව විවිධ අදහස් පළ වූ බව සඳහන් කල ගරු මන්ත්‍රීතුමා , බළන්ගොඩ එක්සත් ජාතික පක්ෂ ප්‍රධාන සංවිධායක ලෙස විජය නිල්මිණි මැතිතුමා දිර්ඝ කාලයක් කටයුතු කල අතර , එතුමා මෙම ප්‍රදේශයට සිදුකල සේවය සම්බන්ධ කරුණු දක්වන ලදි. ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් එවන් සේවයක් කල අයෙකු එම ධූරයෙන් ඉවත්කර වෙනත් අයෙකු එම ධූරයට පත්කිරීම සම්බන්ධව තමා කණගාටුවන බව ප්‍රකාශ කරන ලදී. පසුගිය දා පැවති පාර්ලිමේන්තු මහා මැතිවරණයට සබරගමුව පළාත් සභාවේ ගරු පළාත් සභා මන්ත්‍රීවරයෙකු වන භාණු මුණිප්‍රිය මැතිතුමා අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් වූ අතර , එතුමාට ජයග්‍රණය කිරීමට නොහැකි වූ බව දැන්වීය. භාණු මුණිප්‍රිය මැතිතුමා ප්‍රබල දේශපාලන චරිතයක් නොවුන ද එතුමා ඉතා හොඳ සුහඳශීලි අයෙකු බව දැන්වීය. කෙසේ වෙතත් එක්සත් ජනතා සංධානයෙන් මෙවර ද බළන්ගොඩ ආසනයට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු පත්කරගැනීමට අවස්ථාව අහිමි වූ බව දැන්වීය. එම නිසා රත්නපුර දිස්ත්‍රික්කය සඳහා තේරී පත් වූ පාර්ලිමේන්තු මැති ඇමතිවරුන්ගේ සහය ලබාගෙන ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් සේවය කිරීමට ගරු සභාපතිතුමා / උපසභාපතිතුමා විශේෂ අවධානයකින් යුතුව කටයුතු කරනු ඇතැයි තමන් විශ්වාස කරන බව දැන්වීය.

මෙම සභාවේ විපක්ෂ ගරු මන්ත්‍රී විමලසේන වැවේගෙදර මැතිතුමා , බළන්ගොඩ ඇල්ලෙපොල වැවේගෙදර මාර්ගයේ පැති බැම්ම සාදා දෙන ලෙස ඉල්ලීමක් කල බවත් , එතුමා මෙම සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කල කාලය තුළදී අදාල සංවර්ධන කටයුත්ත ඉටුකිරීමට අවස්ථාව තිබුණු බවත් , නමුත් ඒ සම්බන්ධව අවධානය යොමුනොකර වත්මන් මෙම සභාව වෙත ඒ සම්බන්ධව චෝදනා කිරීම යුක්ති සහගත නොවන බව අවධාරණය කරන ලදී.

**14. <u>අවසානයඃ</u>**

**<u>ගරු සභාපති - ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමාඃ</u>**

අද දින සභාවේ කටයුතු සාර්ථක කරගැනීම සඳහා සහයෝගය ලබාදුන් ගරු මන්ත්‍රීවරුන්ටත් , ලේකම් මහතාටත් සිය ස්තුතිය ප්‍රකාශ කරමින්, සභාවේ වැඩ කටයුතු ප.ව. 02.30 ට පමණ අවසන් කරන ලදී.

ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.